# වසර 2019 මැයි මස තුළ උද්ගතව ඇති ජාතිවාදී ප්‍රචණ්ඩත්වය පිලිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රවෘත්ති නිවේදනය

වසර 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ ඉරිදා පාස්කු දින ප්‍රහාරයේ පටන් මුස්ලිම් ප්‍රජාවට එරෙහිව වර්ධනය වෙමින් පවත්නා ජාතිවාදී ප්‍රචණ්ඩක්‍රියා සමුදාය පිලිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි තැතිගැනීමකට ලක්ව ඇත.

මීගමුවේ දී නොබෝදා සිදු වූ සහ තවදුරටත් මීගමුව ද ඇතුළත්ව හලාවත, කුරුණෑගල, කුලියාපිටිය, හෙට්ටිපොල, දුම්මලසූරිය, රස්නායකපුර, කොබෙයිගනේ, බිංගිරිය හා වෙනත් ප්‍රදේශයන්හි ද හටගෙන ඇති සිද්ධීන් මගින් ද විද්‍යමාන වන්නේ, ප්‍රචණ්ඩකාරී පුද්ගලයන් හා කණ්ඩායම්, මුස්ලිම් ජාතිකයන් සතු නිවාස, ව්‍යාපාර හා ඔවුන් වන්දනාමාන කිරීම සඳහා උපයෝගී කරගන්නා ස්ථාන ද ඉලක්ක කරගෙන ඇති බවත්, ඇඳිරිනීතිය පනවා ඇති කාල සමය තුළ පවා එවැනි සිද්ධීන් වාර්තා වී ඇති බවත්ය. තවද මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ජනතාව කුපිත කරමින් එකිනෙකා අතර සීග්‍රයෙන් සංසරණය වෙමින් පවත්නා වීඩියෝ දර්ශන හා සමාජ ජාල පණිවුඩ මගින් මෙකී ප්‍රචණ්ඩත්වය තව තවත් දිරිගන්වමින් ඇති බව ද පෙනී යන කරුණකි.

එමෙන්ම අතීතයේදී ද නැවත නැවතත් අත්දුටුව අවාසනාවන්ත ප්‍රවණතාවයක් විදහා දක්වමින්, මෙලෙස හටගෙන ඇති ප්‍රචණ්ඩත්වය සමනය කිරීම උදෙසා, ආරක්ෂක බලධාරීන් අවැසි ක්‍රියාමාර්ග නොගැනීම හෝ ප්‍රමාද කිරීම පිළිබඳව වූ වාර්තා කෙරෙහි ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම බලවත් අවධානය යොමු කර සිටී. එහිලා තවදුරටත් ප්‍රචණ්ඩත්වය පැතිරීම වළක්වමින්, එය පාලනය කිරීම උදෙසා, ආරක්ෂාව තහවුරු කිරීමේ කඩිනම් හා ප්‍රෝත්සාහි උත්සාහයන් ගැනීමට වහා ක්‍රියා කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අදාළ බලධාරීන්ගෙන් උදක්ම ඉල්ලා සිටී.

තවද, උද්ගතව ඇති ප්‍රචණ්ඩකාරී සිදුවීම් කෙරෙහි, දැනට පවත්නා නීතිමය රාමුව තුළ, අදාළ බලධාරීන් කාලානුරූපව මෙන්ම වඩාත් ඵලදායී ලෙසින් ප්‍රතිචාර දැක්වීම සහතික කළ යුතුව ඇත. ජාතිවාදී හා ආගම්වාදී ලෙසින් ජනතාව භේද කිරීම උදෙසා ද්වේෂය පතුරුවමින් සිටින කවර හෝ පුද්ගලයෙක් වේවා, නීතිය හමුවට පැමිණවීම සඳහා ක්‍රියා නොකිරීම හෝ ඒ පිලිබඳ කටයුතු කිරීමට අකැමැති වීම දණ්ඩ මුක්තිය (වරදක් කොට දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතිය) වඩාත් තීව්‍ර කරන්නා සේම, එය කිසිලෙසකත් සැහැල්ලුවට ගත යුක්තක් නොවේ. එමෙන්ම ප්‍රචණ්ඩත්වය තවදුරටත් පැතිරීම වළක්වාලීම සඳහා කටයුතු කිරීමේ අසමත් හෝ ඒ පිලිබඳ හැඟීමකින් කටයුතු නොකරන බලධාරීන් වහා තම තනතුරු වලින් ඉවත් විය යුතුව ඇති අතර නොඑසේනම් එවැනි නිලධාරීන් අදාළ තනතුරු වලින් ඉවත් කිරීම සඳහා නීති ප්‍රකාරව කටයුතු කල යුතුව ඇත්තේය. එමෙන්ම අදාළ බලධාරීන්, කිසිදු බියකින් හෝ පක්ෂපාතීත්වයකින් තොරව මිලිනුපුටා දැමිය යුතුව ඇති, අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කෙරෙහි එල්ල වී ඇතැයි දැක්වෙන දේශපාලන බලපෑම් පිලිබඳ වාර්තා කෙරෙහිද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කනස්සල්ලයට පත්ව ඇත. ශ්‍රී ලංකාව, සෑම පුරවැසියෙක්ම නීතිය හමුවේ සමාන, බහු ජාතීන්ගෙන් සැදුම්ලත් බහු ආගමික රටකි. අප සතුව, අපගේ විවිධත්වය කෙරෙහි පවත්නා ගෞරවනීය බැඳීම තහවුරු කිරීම සඳහා, අපගේ දේශපාලන හා ආගමික නායකයන් කටයුතු කල යුතුව ඇති අතර ජාතිවාදය පැතිරීම වැළැක්වීම සඳහා මෙන්ම ඒ ඒ ප්‍රජාවන් තුළ පවත්නා සැක බිය තුරන් කිරීම මෙන්ම සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමෙහිලා ගත හැකි සෑම පියවරක්ම ගත යුතුව ඇත්තේය.